# බෞද්ධ අධ්‍යාපන දර්ශනයෙන් හෙළිවන මුඛ්‍යාර්ථ සංකල්පය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පාතේගම ඥාණිස්සර හිමි

''අධ්‍යාපනය'' යනු කුමක්දැයි සොයා බැලීමේදී විවිධ අධ්‍යාපනඥයන් ඉදිරිපත් කර ඇති අදහස් සැලකිල්ලට ගැනීම වැදගත්ය. අධ්‍යාපනය යන්නට විවිධ අර්ථකථන ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා නිවැරදි නිශ්චිත අර්ථයක් ගෙන දෙන නිර්වචනයක් ඉදිරිපත් කිරීමට අපහසු වී තිබේ. මන්ද එය එතරම්ම සංකීර්ණ වූ අරුත් දනවන පදයක් හෙයිනි. ප්ලේටෝ, ඇරිස්ටෝටල් ආදී පැරණි දාර්ශනිකයන් අධ්‍යාපන පිළිබඳ ව අර්ථ විග්‍රහ ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන තිබේ. මෙහි දී අප උත්සාහ කරනු ලබන්නේ අධ්‍යාපනය යන්නට දිය හැකි නිශ්චිත නිවැරදි අර්ථයක් සොයා ගැනීමටය.

අධ්‍යාපනය යනු පුද්ගලයෙකු පාසලින් ලබන්නා වූ කිසියම් දැනුම් සම්භාරයක් යයි සමස්ත වශයෙන් බොහෝ දෙනා දරන මතය වෙයි. පාසලකින් පුද්ගලයා හට ලබා දෙන අධ්‍යාපනය කුමක්ද? ලිවීම, කියවීම වැනි භාෂා කුසලතා හා විද්‍යාව, ඉතිහාසය, ගණිතය හා ඉංග්‍රීසි වැනි විෂයයන් කීපයක දැනුම ලබාදීම පාසලින් සිදුකරන බව පෙනේ. මෙහිදී අප සොයා බැලිය යුත්තේ පුද්ගලයෙකුට ලබා දෙන්නා වූ මෙම සීමිත දැනුම් පොදුවේ ගෙන ඒ සඳහා අධ්‍යාපනය යන වචනය තැබිය හැකිද? යන්නයි. පුද්ගලයෙකු ජීවිත කාලය තුළ කරන කියන සකලවිධ වූ ක්‍රියා සන්තතියට අදාළ වූ ඥානයක් පාසල් අධ්‍යාපනය තුළින් ඔහුගේ මනසට ප්‍රවේශ වෙනවා ද? නොඑසේ නම් පාසල මගින් ලබාදෙන අධ්‍යාපනය සියලු ජීවිත කාලය ගත කිරීමට අවශ්‍ය දැනුම ලැබෙනවා ද යන්නයි. පාසලින් ඔබ්බට අධ්‍යාපන ක්‍රියාවලිය ගමන් කරනවාද ? අධ්‍යාපනය බෙදා හරින එක ම මධ්‍යස්ථානය පාසල ද?

අධ්‍යාපනය යනු ගැටළු විසඳීමේ ක්‍රියාවලියකි යනුවෙන් ගතහොත් ජීවිතය පුරා පුද්ගලයාට මුහුණ දීමට ලැබෙන ගැටළු පාසල් ජීවිතයේ මුණ ගැහෙනවා ද? යන ප්‍රශ්නය ද සැලකිල්ලට ලක් කළ යුතු වෙයි. පුද්ගලයෙකුට ජීවිතකාලය පුරා ම අවශ්‍ය අධ්‍යාපනය

පාසලට සීමාකොට දැක්වීම කළ නොහැකිය. ප්‍රංශ ජාතික ජේ. ජේ. රූසෝ[1] දක්වන්නේ අධ්‍යාපනය ලැබීම සඳහා ප්‍රධාන කාරක තුනක ඇසුර ලබන්නට සිදුවෙන බවයි. එනම්, ස්වභාව ධර්මය, ද්‍රව්‍යයන් හා මිනිසුන් යනුවෙනි. රූසෝ විසින් දක්වා ඇති මෙම අදහස මගින් අධ්‍යාපනයෙන් හැඟවෙන පුළුල් අර්ථය පිළිබඳව හැඟීමක් ඇති කර ගැනීම අපහසු නොවේ.

අධ්‍යාපනය යන්නට දෙන නිර්වචනයක් ලෙස පුද්ගලයා උපතේ සිට මරණය දක්වා ලබන්නා වූ සියලුම අත්දැකීම් අධ්‍යාපනය යන්න ගත හැකිය. මෙහි අත්දැකීම් යන්න පුළුල් අර්ථයක යෙදෙන පදයක් බව පෙනේ. පුද්ගල ජීවිතයේ ලබන අත්දැකීම් විවිධය. සමාජ සංවර්ධනය පුද්ගල සුභසිද්ධියට අවශ්‍ය නොවන කිසිදු වැදගැම්මකට නැති අත්දැකීම් ද, පුද්ගලයා ජීවිතයේ ලබන අතර ඒවා අධ්‍යාපන යන අදහසින් ගත හැකි ද? යන්න සිත් යොමු කළ යුතු කරුණක් වෙයි.

ධනය, බලය, කුලය වැනි නිර්ණායකයන් යොදාගනිමින් මිනිසා තවකෙකු පහත් කොට සැලකීම, අවතක්සේරුවට ලක් කිරීම, මානව භක්තියට කැළැල් වන අයුරින් කටයුතු කිරීම ආදී විෂම සහගත සමාජ සිද්ධි පුද්ගලයා හට අද්දැකීම් වශයෙන් අත්විඳීමට සිදුවන අතර එබඳු සමාජ හා සදාචාර විරෝධී කයෝර ක්‍රියාවන් අධ්‍යාපනය යනුවෙන් ගත හැකි ද? යන්න සම්‍යක් සංකල්පනාවෙන් විමසා බැලිය යුත්තකි.

ඇමරිකා එක්සත් ජනපදයේ පවතින කළු - සුදු භේදය නිසා මිනිස් අයිතිවාසිකම්වලට පටහැනි වූ ක්‍රියා පවතී. එහි පවත්නා සුදු-කළු භේදයේ ස්වභාවය අවබෝධ කර ගැනීම පිණිස එරට වර්ණ භේදය පවතින ආකාරය විමසා බැලීම වැදගත්ය. පාසල් සංවිධානය තුළ ඇත්තේ ද මෙබඳු රාමුවකි. කළු ජාතිකයන් හට වෙන ම පාසල් ඇති අතර සුදු ජාතිකයන් එම පාසල්වලට යන්නේ නැත. පාසලට ළමයින් ගෙන එන බස් රිය පවා ජාතීන් අනුව වෙනස්ය. සුදු ජාතිකයන්ගේ පාසලට කළු ජාතිකයන් ඇතුළත් නොකිරීමට නීති පවා පනවා තිබේ. මෙබඳු අහිතකර අත්දැකීම් ජීවිතයේ දී පුද්ගලයාට අත්විඳීමට සිදු වෙයි. උසස් බුද්ධි මට්ටමක මිනිසුන් මෙබඳු ක්‍රියා අනුමත නොකරනවා සේ ම තරයේ හෙළා දකිනු ලබයි. සමාජ සම්මතයන්ට පවා පටහැනි වූ මෙබඳු ක්‍රියා මගින් ලබන අත්දැකීම් අධ්‍යාපනය යනුවෙන් අර්ථ

ගැන්විය හැකි ද? උත්පත්තියෙන් පුද්ගලයකු ලබා ඇති ප්‍රකෘති මානසික තත්ත්වය හා සමාජ තත්ත්වය වනසා දමා කෘතිම සමාජ පරිසරයක් බිහිකරන්නේ මිනිසා විසින් ගනු ලබන සමාජ විෂම බල විශේෂයෙන් මගිනි.

අධ්‍යාපනය යනු කෙනෙකු යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියකට සමානය යනුවෙන් ආර්.එස්. පීටර්ස් ප්‍රකාශ කරයි. මෙම නිර්වචනය තුළ පවත්නා, යථා තත්ත්වයට යන පදය පිළිබඳ ව විමසීමක් කළ යුතුව ඇත. යම්කිසි පුද්ගලයෙකු යථා තත්ත්වයට පත්වීමට නම් ඔහු යම්කිසි විකෘතියකින් පෙළෙන්නෙකු විය යුතු අතර එම උමතු බවින් මුදවා ගැනීමේ ක්‍රියාවලිය අධ්‍යාපනය නම් වේ. සිහි විකල් වූවකු එම තත්ත්වයෙන් මුදවා ගැනීමට වෙදකම් කිරීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වෙයි. එහිදී රෝගයට හේතුව සෙවීම, රෝගය සුව කරනු සඳහා අවශ්‍ය ඖෂධ භාවිතය වැනි දේවල් අවශ්‍ය වන අතර ඒවා ශරීර ගත කිරීම ද කළ යුතු වූවකි. අධ්‍යාපනය දීමේදී ගුරුවරයාට ද මෙසේ කරුණු කීපයක් අධ්‍යාපනය කිරීමට සිදුවෙයි. එනම් වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කරන පරිදි ගුරුවරයා විසින් ද ළමයකු උගෙනුම පිණිස යොමු කරවන විට ළමයාගේ වයස, එතෙක් ඔහු ලබාගෙන ඇති දැනුම් ප්‍රමාණය, ළමයා ජීවත් වූ පරිසරය, ඔහුගේ සම වයස් කණ්ඩායම් යන කරුණු පිළිබඳව සොයා බැලීමට සිදුවෙයි. මේ අනුව රෝගියෙකු සුවපත් කිරීම හා දරුවෙකුට අධ්‍යාපනය දීම අතර යම් බඳු සමානකමක් පෙනුනත් අධ්‍යාපන ක්‍රියාවලිය ගිලිහුණු මට්ටමකින් පෙර සිටි මට්ටමකට පත් කිරීමේ ක්‍රියාවලියකට වඩා බෙහෙවින් වෙනස්ය. මන්ද? අධ්‍යාපනය කෙරේ යොමු කරවන දරුවකු අමුතුවෙන් යථා තත්ත්වයට පැමිණවීමක් අවශ්‍ය නොවන හෙයිනි. එසේ ම අධ්‍යාපනයෙන් එබඳු දෙයක් අදහස් කරන බවක් නොපෙනෙන හෙයිනි.[2]

අන් බොහෝ අධ්‍යාපන දාර්ශනිකයන්ට වඩා බුදුරජාණන් වහන්සේ විසින් වඩාත් පුළුල් වූත්, ගැඹුරු වූත් දෘෂ්ටිකෝණයකින් මිනිසා පිළිබඳව විවරණය කොට ඇත. ඒ අනුව තම ඉගැන්වීමේ ක්‍රියාදාමය සංවිධානය කොට තිබේ. ඒ නිසා බෞද්ධ අධ්‍යාපනය අර්ථවත් කරගත හැක්කේ බුදුරජාණන් වහන්සේ විසින් මිනිස් සිතේ ක්‍රියාකාරිත්වය පිළිබඳව දෙන ලද අර්ථ කථන කවරේදැයි මැනවින් වටහා ගැනීමෙන් අනතුරුව පමණි.[3]

බෞද්ධ අධ්‍යාපනය තුළ සිතට කෙබඳු තත්ත්වයක් අත්කර දී ඇතිදැයි පැහැදිලි කර ගැනීමට අපහසු නොවන්නේ සිත පිළිබඳව බුදුසමය දක්වන විවිධ විස්තර විවරණ නිසාවෙනි. ස්කන්ධ පංචකයකින් පිරුණා වූ පුද්ගල ශරීරයේ වඩාත් වැදගත් මෙහෙයක් ඉටුකරනු ලබන්නේ සිත මගිනි. පුද්ගලයා යම්කිසි ක්‍රියාවක් කිරීම හෝ නොකිරීම පිළිබඳව තීරණය කිරීමේදී පෙරමුණ ගන්නේ සිත හෙවත් මනස ය. සියලු ක්‍රියාවන්ට පෙරටු වන්නේ මනස ය. ශ්‍රේෂ්ඨ වන්නේ ද මනස ය.[4] චිත්ත සන්තානය තුළ පවතින ප්‍රමුදිත බව, ප්‍රසන්න බව පුද්ගලයා යහපත් අරමුණු කෙරෙහි යොමුකර වීමට සමත් වන අතර අයහපත් අරමුණු විසින් පුද්ගලයා අයහපත් පුද්ගලයෙකු බවට පත් කරනු ලබයි.[5]

සිවුපා සතුන් හා පක්ෂීන් ඇසුරු කර ගනිමින් නූතන මනෝවිද්‍යාඥයින් විසින් කරනු ලැබ ඇති පර්යේෂණ මගින් ඔවුන් හෙළි කිරීමට උත්සාහ ගනු ලැබුවේ මිනිසාගේ සිත ක්‍රියාත්මක වන ආකාරය වටහා ගැනීමයි. සාර්ථක ඉගැන්වීම් කාර්යයක් ඉටු කිරීමේදී එහි පවතින ඖචිත්‍යය ඔවුන් වටහා ගෙන තිබේ. බාහිර චර්යා පෙන්වන ලක්ෂණ මගින් සිත ක්‍රියාකරන ආකාරය අනුමාන වශයෙන් මනෝවිද්‍යාඥයින් අවබෝධ කර ගැනීමට සමත් වූ අතර ඍජු ලෙස සිත පිළිබඳ ව අවබෝධ කර ගැනීමට ඔවුහු අසමත් වූහ.

බුදුසමය පුද්ගල සිත පිළිබඳ අවධාරණය කරනු ලබන්නේ මෙයට හාත්පසින් ම වෙනස් ආකාරයකට ය. සියලු කෙලෙස් ප්‍රහීණ කළ බුදු හිමියෝ පුද්ගලයා පිළිබඳව අතීත අනාගත සියලු විෂමතාවන් පිළිබඳව ලැබුවේ අතැඹුල සේ දැනුමකි. එනිසා උන්වහන්සේ නූතන මනෝවිද්‍යාඥයන් මෙන් නොව සිත පිළිබඳව ලැබුවේ ඍජු අවබෝධයකි. උන්වහන්සේ සිත පිළිබඳව ලැබූ ඍජු අත්දැකීම හේතුවෙන් බෞද්ධ අධ්‍යාපනයෙහි පදනම වැටුණේ සිතේ ප්‍රසන්න බව සොයා යාම පිළිබඳවය. ලෝකය මිනිස් සිත මගින් හසුරුවන බව පැහැදිලි කොට ඇත. භෞතික පරිසරය තුළ ඇතිවන්නා වූ සියලු වෙනස්වීම්වලට හේතුවන්නේ පුද්ගල සිතය. එනිසා සිතෙහි ප්‍රසන්න බව හා ප්‍රමුදිත බව ඇති කරගත යුතු අතර යහපත් ලෙස සිත දියුණු කර ගැනීම මගින් බෞද්ධ අධ්‍යාපනය අපේක්ෂිත පරමාර්ථය වූ පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයකු බවට පත්විය හැකි අතර අයහපත්

පැත්තට යොමුකරනු ලබන සිත ඇති පුද්ගලයා පාපී පුද්ගලයෙකු බවට පත් වේ.[6]

බෞද්ධ අධ්‍යාපනයේ ආරම්භක දාර්ශනිකයාණන් වන බුදුරජාණන් වහන්සේ ඥාන ගවේෂණ සමයෙහි එනම්, සිද්ධාර්ථ තාපසයා ලෙසින් ආලාර කාලාම සහ උද්දකරාම පුත්ත යන ශාස්තෘවරුන් සොයා ගෙන ගියේ ය.[7] එහිදී එතුමන් විසින් අභිඤ්ඤා සහ සමාපත්ති පිළිබඳව යම්බඳු දැනුමක් ලබා ගනු ලැබූව ද බුද්ධත්වය සඳහා එය ප්‍රමාණවත් වූයේ නැත. අවසානයේ හුදකලාව වෙසෙමින් මානසික සියලු විභවතා ජයගෙන සම්බෝධියට පත්වීමට උන්වහන්සේට හැකි විය. ඒ සඳහා උන්වහන්සේ විසින් පසක් කරගනු ලැබුවේ තෙවිජ්ජා පිළිබඳව වූ ඥානය යි. එනම්, ලෝකයේ සත්ත්වයන් උපදින මියයන ආකාරය පිළිබඳව වූ චූතූපාතඥානය, ලොව පවතින සියල්ල ඒ අයුරින් ම දැක ගත හැකි දිබ්බචක්ඛු ඥානය සිත තුළ පවතින සියලු කෙලෙස් ධර්මයන් ප්‍රහාණය කරනු ලබන ආසවක්ඛය ඥානය යන ඥානයන් ය. මෙම ඥානයන් පසක් කරනු ලැබුවේ මනසෙහි පවතින සියලු ක්ලේෂ ධර්මයන් ප්‍රහීණ කරමිනි.

පුද්ගලයාගේ සිත උපතින් ප්‍රභාස්වර වූවක් වෙයි. එය කිළිටි වන්නේ බාහිර සමාජ බලවේග මගින් ඇතිවන්නා වූ උපක්කිලේස නිසාය.[8] උපතින් පවත්නා වූ මනසෙහි ප්‍රසන්න භාවය පවත්වා ගැනීම වැදගත්ය. එකී ප්‍රසන්න බව පවත්වා ගැනීමට අපහසු වන්නේ ආගන්තුක වශයෙන් පැමිණෙන උපක්කිලේස නිසාවෙනි. ලෝභ, ද්වේෂ, මෝහ යන ප්‍රේරණ නිසා ප්‍රසන්න බවින් යුතුව සිත පවත්වාගෙන යාම අපහසුය. ඒවා අකුසල මූල වශයෙන් හඳුන්වා ඇති අතර ඒවා සමතික්‍රමණය කරමින් අලෝභ, අදෝස, අමෝහ යන සුභවාදී මානසික තත්ත්වයන් ඇති කර ගත යුතු වෙයි.

අධ්‍යාපන යාවජීව ක්‍රියාවලියක් ලෙස නූතන අධ්‍යාපනඥයන් විසින් අර්ථකථනය කොට තිබේ.[9] පුද්ගලයකු ජීවිත කාලය පුරාම ලබන්නා වූ අද්දැකීම් ප්‍රමාණය අධ්‍යාපනය වශයෙන් සලකා ඇත. බෞද්ධ අධ්‍යාපනය කෙබඳු ක්‍රියාවලියක් දැයි විමසා බැලීමේදී එය නූතන අධ්‍යාපනඥයන්ගේ මත සමතික්‍රමණය කරමින් ඉදිරියට ගමන් කරන අයුරු පෙනේ. බෞද්ධ අධ්‍යාපනය යාව නිබ්බාන ක්‍රියාවලියකි.[10]

යම් පුද්ගලයකු මේ අත්බවයේ ලබන අද්දැකීම් ඵලග භාවයට ද එකතු වේ. මෙසේ භවගාමී ක්‍රියාවලියක් වශයෙන් සැලකිය හැකි බෞද්ධ අධ්‍යාපනය නිවන් දකිනා ජාති දක්වා පුද්ගලයකුට අවශ්‍ය වන අතර පූර්ණ පෞර්ෂයකින් හෙබි පුද්ගලයකු බවට පත්වන්නේ එම අවස්ථාවේදී ය.

පුද්ගලයා සියලු කෙලෙස් ධර්මයන් ප්‍රහීණ කොට මනසෙහි සුපහන් බව ඇති කර ගනිමින් නිර්වාණය සම්ප්‍රාප්ත වෙයි. පුද්ගලයාට ලබන්නා වූ නිවන ප්‍රභේද වශයෙන් කොටස් දෙකක් වශයෙන් දැක්විය හැකි වෙයි. බෞද්ධ අධ්‍යාපන විෂයමාලාව වශයෙන් ඒවා වර්ගකොට බෙදා දැක්විය හැකි වෙයි. බෞද්ධ අධ්‍යාපන විෂයමාලාව සාර්ථකව නිමකොට නිර්වාණගාමී ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥතා ඥානයෙන් ප්‍රවිචේධ කළ රහත්හු ද වෙති.

බෞද්ධ අධ්‍යාපනයේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීමේදී ද පසු කළ යුතු අවස්ථා කීපයක් වෙයි. සෝවාන් මාර්ගඥානය, සකෘදාගාමී මාර්ගඥානය, අනාගාමී මාර්ගඥානය, අරහත් මාර්ග ඥානය යනුවෙන් ඒවා දැක්විය හැකිය. මෙම ඥානමාර්ග උපදවා ගත යුතු වන්නේ ද තමන්ගේම උත්සාහයෙනි.

බෝධි යනු ලෝකෝත්තර ඥාන මාර්ගවලට කියන තවත් නමකි. බෝධි නම් වූ ලෝකෝත්තර ඥානයක් ලැබීමට ඇති කර ගැනීමට උපකාරවන ධර්ම සමූහයක් ඇත්තේය. එයට බෝධිපාර්ෂික ධර්ම යයි කියනු ලැබේ. අතසුතතම වූ ලෝකෝත්තර මාර්ගඥානය වැඩීමට කළ යුතු දෙය නම් බෝධිපාර්සික ධර්ම වැඩීම ය.[11]

බෞද්ධ අධ්‍යාපනයේ අපේක්ෂිත අරමුණු සාධනය සඳහා සැකසුණු විෂය මාලාවක් (Curriculum) ඇති අතර ඒවා හඳුන්වනු ලබන්නේ බෝධිපාක්ෂික ධර්ම නමිනි. මෙකී ධර්ම පර්යාය මනාව ප්‍රගුණ කිරීම අත්‍යවශ්‍ය වූවක් වන අතර නිර්වාණගාමී මාවතට මග වන්නේ ද එයම ය. බෝධිපාක්ෂික ධර්ම වැඩීම ක්‍රම දෙකක් ඔස්සේ කළ හැකි අතර එයින් තමන්ට උචිත මගක් වෙන් කර ගැනීමේ වගකීම ඒ ඒ පුද්ගලයන් වෙත පැවරෙයි. එම ක්‍රම දෙක මෙලෙස දැක්විය හැකිය.

ජීවනෝපාය වශයෙන් නොයෙක් දෑ කරමින් අඹුදරුවන් පෝෂණය කරන අතර අවකාශ ලත් පරිදි හැකි පමණක් ඒවා වැඩීමෙහි ද යෙදීම එක් ක්‍රමයක් වන අතර අන් සකලවිධ වූ වැඩකටයුතු නතරකොට නිවන් මග ගමන් කිරීම තමාගේ ප්‍රධාන කෘත්‍යය ලෙස සලකා එහි ම උග්‍ර වශයෙන් යෙදීම අනෙක් ක්‍රමය වෙයි. දෙවෙනි ක්‍රමය අනුගමනය කරනු ලබන්නා ඉක්මනින් ධර්මය ප්‍රතිවේධ කරනු ලබන අතර ප්‍රථම ක්‍රමය අනුගමනය කරන්නාට වැඩි කාලයක් ගත කිරීමට සිදුවෙයි.

බෝධිපාක්ෂික ධර්ම නොවැඩූ පුද්ගලයන්ගේ චිත්ත සන්තානයෙහි කෙළෙස් මළ බහුල ය. ඒ නිසා ඔවුනට සිල් රැකීම බරක් ලෙස වැටහෙයි. සමාදන් වූ ශිලයෙහි පිහිටා සිටීම ද අපහසු වෙයි.[12] බෞද්ධ අධ්‍යාපන ක්‍රියාවලියේ දී සීලයට හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. කය, වචන දෙකේ සංවරය ශීලය යනුවෙන් හඳුන්වන අතර ශීල සමාදානය එහි ප්‍රථම අදියර වෙයි. ශීලයෙන් අරඹා ප්‍රඥාවෙන් කෙළවර කෙරෙන බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය සඳහා ඉමහත් බලපෑමක් බෝධිපාක්ෂික ධර්ම[13] වැඩීමට හිමිවන අතර බෞද්ධ අධ්‍යාපන සංකල්පය කෙබඳු ද යන්න එමගින් මැනවින් ප්‍රකට කෙරේ.

සතිය හෙවත් සිහිය මැනවින් පිහිටුවා ගැනීම සෑම අවස්ථාවක දීම පුද්ගලයා විසින් කළ යුතු වෙයි. පුද්ගලයා සෑම ඉරියව්වකදී ම ''මම දැන් මෙම ඉරියව්ව පවත්වමි'' යන කල්පනාව ඔහු කෙරේ පැවතීම අවශ්‍ය වන්නේ ය. සතර සති පට්ඨානය ප්‍රමුඛ වශයෙන් විවරණය කොට දක්වා තිබේ.[14] බෞද්ධ අධ්‍යාපන ක්‍රියාදාමයේ දී මේ සඳහා ප්‍රමුඛ ස්ථානයක් හිමි වී තිබේ. කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව හා ධම්මානුපස්සනාව සතර සතිපට්ඨානය ලෙස හැඳින්වෙයි.

මෙයට අමතර ව සතර ඍද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සත්තබොජ්ඣංග සහ ආර්ය අෂ්ටාංගික මාර්ගය යන කොටස් බෝධිපාක්ෂික ධර්මවලට අන්තර්ග්‍රහණය වී තිබේ. මේවා මගින් බුදුසමය බෞද්ධ අධ්‍යාපනය මගින් අපේක්ෂිත වන අරමුණ කෙබඳු දැයි අවබෝධ කර ගැනීමට අපහසු නැත. පුද්ගලයා තුළ සමාජ හිතකාමී ආකල්පයක් ඇති වීම තුළින් තමා සහ අන්‍යයන් කෙරෙහි ඇති කර ගැනීමට බලාපොරොත්තු වන්නේ පොදු වූ හැඟීමකි.

උනුනුන් කෙරෙහි වෛරයෙන් ද්වේශයෙන් බැලීමට පුද්ගලයා හුරු නොකරන බෞද්ධ අධ්‍යාපනය වෛරී ජනතාව අතරෙහි අවෛරී ව ජීවත් වීමට පුද්ගලයා හුරු කරයි.[15] කෙලෙස්වලින් ආතුර වූ පුද්ගලයන් වෙසෙන සමාජයේ අනතුරුව ජීවත්වීමට උගන්වනු ලබයි.[16]

බෞද්ධ අධ්‍යාපනය තුළින් පුද්ගලයා නැඹුරු කරන මෙම යහපත් ආකල්පය සුවිශේෂ වූවකි. එමගින් අපේක්ෂිත වන්නේ ද වඩාත් සුචරිතවාදී සමාජ ක්‍රමයක් වන අතර සිවුවනක් පිරිසගෙන් සමන්විත බෞද්ධ සමාජයේ ශක්තිමත් පදනම වන්නේ ද එයමය. සමාජ හිතකාමී පුද්ගලයන් වඩ වඩාත් සමාජයට දායාද කිරීමේ අභිලාෂය බෞද්ධ අධ්‍යාපනය මගින් අපේක්ෂිත ය.

වෙසක් පොහෝ දා බෝමැඩ මුල දී බුදුරජාණන් වහන්සේ සත්ත්වයාට ධර්ම දේශනා කිරීම පිළිබඳ උකටලී බවක් ඇති කරගනු ලැබ ඇත. එනමුදු පසුව එම තීරණය වෙනස් කළ අතර ඉසිපතනාරමයේ පස්වග මහණුන් හට ධර්ම දේශනා කොට තිබේ.[17] එම ධර්ම දේශනාවේ ද කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ ප්‍රථමයෙන් ධර්මය අවබෝධ කරගනු ලැබූහ. උන්වහන්සේ ප්‍රථම බෞද්ධ ශ්‍රාවකයා වූ අතර පිළිවෙළින් වප්ප, භද්දිය, මහානාම හා අස්සජී යන තෙරුන් වහන්සේලා ධර්මය අවබෝධ කළහ. සියලු දෙනා ම අවබෝධ පූර්වක පුද්ගලයන් බවට පත්වූයේ පසුව දේශනා කරනු ලැබූ ධර්මය අසාය.[18] එවකට බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ ශිෂ්‍ය පිරිස් පස් දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඒ සියලුම දෙනා අවබෝධ පූර්වක පුද්ගලයන් බවට පත් ව සිටියහ. යසකුල පුත්‍ර ඇතුළු පිරිස පැවිදිවීමෙන් පසු ප්‍රථම ධර්ම දූත පිරිම හැට දෙනෙක් බවට පත් වූ අතර ඒ සියලු ම දෙනා රහත් බවට පත් වූ අය වූහ. එම පිරිස අරභයා බුදුහිමියන් ප්‍රකාශ කරනු ලැබුවේ පොදු ප්‍රකාශයකි. ''මහණෙනි බොහෝ දෙනාගේ හිත සුව පිණිස චාරිකාවෙහි හැසිරෙන්න. දෙදෙනෙකු එක මගින් නො යන්න. මුල, මැද, අග පිරිසිදු ධර්මය දේශනා කරන්න''[19] යනුවෙනි. සමස්ත බෞද්ධ අධ්‍යාපන ප්‍රතිපදාවේ ස්වභාවය මෙම ප්‍රකාශය තුළ ඇත. අවබෝධ පූර්වක සියලු භික්ෂු පිරිසට උන්වහන්සේ දුන් අවවාදය වූයේ සියලු දෙනාට ධර්මය දේශනා කරන ලෙස ය. එනම් අධ්‍යාපනය ලබාදෙන ලෙස ය. නිස්සරණාධ්‍යාශය බෞද්ධ අධ්‍යාපනයේ පදනම බවට පත් වී ඇත.

බුද්ධ ශාසනය, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවනක් පිරිසෙන් සමන්විත වෙයි. භික්ෂු සමාජය ඇති වීමෙන් වර්ෂ කීපයකට පසුව භික්ෂුණී සමාජය ද, ඇති වූ අතර උපාසක උපාසිකා යන දෙපිරිස ද බිහි වී තිබේ. ක්‍රි.පූ. 6 වන සියවසේ භාරතයේ පැවති බ්‍රාහ්මණ ආදිපත්‍යයට පටහැනිව බිහි වූ බෞද්ධ ශ්‍රාවක පිරිස ජාති - ගෝත්‍ර භේදයෙන් තොර විය. එවකට පැවති චතුර්වර්ණය නම් වූ කුල ක්‍රමය වෙනුවට මිනිසා බෙදන මගක් වශයෙන් නො සැලකූ බුදුසමය එම වචනයෙහි ලා සිව්වනක් පිරිස ඇතුළත් කර ඇති බව පෙනේ. අධ්‍යාපනය සඳහා කුල භේදය අවශ්‍ය වන්නේ නැත. එවකට පැවති සමාජය අධ්‍යාපනය විෂයෙහි කුල ක්‍රමය අනුගමනය කළ ද බෞද්ධ අධ්‍යාපනයේ දී එම ක්‍රමයෙන් සියල්ල බැහැර කරනු ලැබ තිබේ.[19] යනුවෙනි. සමස්ත බෞද්ධ අධ්‍යාපන ප්‍රතිපදාවේ ස්වභාවය මෙම ප්‍රකාශය තුළ ඇත. අවබෝධ පූර්වක සියලු භික්ෂු පිරිසට උන්වහන්සේ දුන් අවවාදය වූයේ සියලු දෙනාට ධර්මය දේශනා කරන ලෙස ය. එනම් අධ්‍යාපනය ලබාදෙන ලෙස ය. නිස්සරණධ්‍යාශය බෞද්ධ අධ්‍යාපනයේ පදනම බවට පත් වී ඇත.

බුද්ධ ශාසනය, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවනක් පිරිසෙන් සමන්විත වෙයි. භික්ෂු සමාජය ඇති වීමෙන් වර්ෂ කීපයකට පසුව භික්ෂුණී සමාජය ද, ඇති වූ අතර උපාසක උපාසිකා යන දෙපිරිස ද බිහි වී තිබේ. ක්‍රි.පූ. 6 වන සියවසේ භාරතයේ පැවති බ්‍රාහ්මණ ආදිපත්‍යයට පටහැනිව බිහි වූ බෞද්ධ ශ්‍රාවක පිරිස ජාති - ගෝත්‍ර භේදයෙන් තොර විය. එවකට පැවති චතුර්වර්ණය නම් වූ කුල ක්‍රමය වෙනුවට මිනිසා බෙදන මගක් වශයෙන් නො සැලකූ බුදුසමය එම වචනයෙහි ලා සිව්වනක් පිරිස ඇතුළත් කර ඇති බව පෙනේ. අධ්‍යාපනය සඳහා කුල භේදය අවශ්‍ය වන්නේ නැත. එවකට පැවති සමාජය අධ්‍යාපනය විෂයෙහි කුල ක්‍රමය අනුගමනය කළ ද බෞද්ධ අධ්‍යාපනයේ දී එම ක්‍රමයෙන් සියල්ල බැහැර කරනු ලැබ තිබේ.

කාන්තාවන් පිළිබඳ කරුණු විමසූ භද්දවග්ගිය කුමාරවරුන්ට බුදුහිමියන් ප්‍රකාශ කරනු ලැබුවේ අනුන් ගැන සෙවීමට වඩා වැදගත් වන්නේ තමන් ගැන සෙවීම බවය.[20] භද්දවග්ගිය කුමාරවරුන්ගෙන් අනතුරුව වූ ජටිල දමනය, පාවාරික අඹවනයට යාම, වේළුවනාරාම

පූජාව දක්වා ඇති සංසිද්ධීන් බෞද්ධ අධ්‍යාපනයේ ශිෂ්‍ය පිරිස වර්ධනයෙහි ලා වැදගත් වන අතර බිම්බිසාර රජුගේ වේළුනාරාම පූජාවෙන් පසුව බෞද්ධ අධ්‍යාපනය ආයතන ගත වීමක් දක්නට ලැබේ. මුල් යුගයේ සියලු ම ශ්‍රාවකයෝ අවබෝධ පූර්වක පුද්ගලයන් බවට පත්වී ඇති අතර බොහෝ භික්ෂූහු රහත්මගට පිළිපන්නෝ වූහ.

බුදුසමයේ ශීඝ්‍ර ව්‍යාප්තියට බලපෑ හේතු රාශියක් විය. ඒවා අතර අන්තගාමී ක්‍රියා පටිපාටිය අනුගමනය කළ සමාජයට එයින් බැහැරව මධ්‍යම ප්‍රතිපදාව නම් වූ නවතම ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දීම වෙසෙසින් වැදගත් විය. මෙම නව හඳුන්වාදීම ශ්‍රාවකයන් අතර පමණක් නොව සමස්ත සමාජ රාමුව තුළ ම ව්‍යාප්තව ගියේ ය. අත්තකිලමතානුයෝගී පිළිවෙත අනුගමනය කළෝ ශරීරයට දැඩි දුක් දීමේ ව්‍රත සමාදන් වූ අතර කාමසුඛල්ලිකානුයෝගය අනුගමනය කළෝ ශරීරයට අධික සැප දෙමින් සුවපහසු සයනයෙහි වැතිරෙමින් ජීවිත ගතකොට තිබේ. මෙම අන්තගාමී පිළිවෙත්[21] දෙකම බැහැර කළ බුදුහිමියෝ කාමසුඛල්ලිකානුයෝගී පිළිවෙත දැඩිසේ බැහැර කරනු ලැබුවේ එමගින් කිසිදු මානසික දියුණුවක් නොලබන බැවිනි.

පුද්ගලයාටම සිතාමතා කටයුතු කිරීමේ අයිතිය පවරා දෙමින් නිදහස් චින්තනය ගරු කිරීම, පුද්ගල කේන්ද්‍රීය බව, සමාජ විෂමතාව හා සමානාත්මකතාව, ප්‍රජාතන්ත්‍රිය බව, ලෞකික අපේක්ෂාවලින් බැහැරව ආදර්ශමත් නියාමක පිරිසක් බිහිවීම ආදී කරුණු බෞද්ධ අධ්‍යාපනය ශිෂ්‍යයන් අතරෙහි ශීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු විය.

බෞද්ධ අධ්‍යාපනයේ අරමුණ කුමක්දැයි සොයා විමසා බලන විට මූලික බුද්ධ වචනයෙන් බැහැර යා නොහැකිය. බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත්තේ පුද්ගලයා සංසාරභව චක්‍රයෙන් එතෙර කරවීම පිණිස ධර්මය දේශනා කරනු ලබන බවය. සියල්ල මැනවින් අවබෝධ කොට සංසාරයෙන් මිදී සැනසීම උදාකර හෙයින්[22] සකල සත්ව ප්‍රජාව ම එක් දුඃඛ සදාගත තත්ත්වයෙන් එතෙර කරවීම උන්වහන්සේගේ අරමුණ වී තිබේ. මුහුදේ ජලය ලවන වන්නේ යම්සේද එසේ ම බුද්ධ ධර්මය තුළ ඇත්තේ විමුක්ති රසය යි.[23]

බෞද්ධ සූත්‍රධර්ම විමසා බැලීමේදී පැහැදිලි වන ප්‍රමුඛ ලක්ෂණයක් වන්නේ නිර්වාණය පිණිස හේතු භූත නොවන කාරණා කෙරෙහි

උන්වහන්සේ උනන්දුවක් දක්වා නොමැති බවය.[24] පාරභෞතිකමය වූ ප්‍රශ්න දහයක් මැදුම් සඟියේ අග්ගිවච්චගොත්ත, චූල මාලුංඛ්‍ය වැනි සූත්‍රවල එයි. එම ප්‍රශ්න අව්‍යාකෘත ප්‍රශ්න වශයෙන් දැක්විය හැකි අතර එම සූත්‍රද්වයෙන් ම දැක්වෙන ප්‍රශ්න මෙසේ ය.[25]

1. ලෝකය ශාස්වත ද?
2. ලෝකය අශාස්වත ද?
3. ලෝකය අන්තවත් ද?
4. ලෝකය අනන්තවත් ද?
5. ආත්මයත් සිරුරත් එකම ද?
6. ආත්මයත් සිරුරත් දෙකක් ද?
7. තථාගත මරණින් මතු සිටී ද?
8. තථාගත මරණින් මතු නො සිටී ද?
9. තථාගත මරණින් මතු සිටී හා නො සිටී ද?
10. තථාගත මරණින් මතු නොම සිටියි හා නොම නොසිටී ද?

මෙම ප්‍රශ්න දෙස විමර්ශනාක්ෂියෙන් බලන කල්හි බුද්ධි ප්‍රභාව විහිදී ගිය පුද්ගලයෙකුගේ මනසෙහි පහළ විය හැකි ප්‍රශ්නයෝ වෙති. බෞද්ධ අධ්‍යාපනය තුළ මෙබඳු පාරභෞතික ප්‍රශ්නවලට ප්‍රමුඛ ස්ථානයක් නොලැබුණේ එබඳු ප්‍රශ්න විස්සර්ජනය කිරීම මගින් පුද්ගලයාට සිදුවන මෙහෙයක් නොමැති නිසාය.

නිර්වාණාභිමුඛ වූ බෞද්ධ ප්‍රතිපදාව තුළ සකස් වූ සියලු අධ්‍යාපනික ශික්ෂණය ඒ කෙරෙහි උපයුක්ත වී ඇති අතර ඒ සඳහා හේතු භූත නොවන සියලු දේ ප්‍රතික්ෂේප වී ඇත. බුදුසමයෙන් යථෝක්ත ප්‍රශ්නවලට පිළිතුරු දී නැත.[26] එයට හේතු එම සූත්‍රයෙහිම විස්තර කොට තිබේ. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම නිර්වේදය පිණිස හේතු නොවෙයි. (නිබ්බිදාය) විරාගය පිණිස හේතු නොවෙයි (න විරාගාය) නිරෝධය පිණිස හේතු නොවෙයි (න නිරෝධාය) ව්‍යුපසමය පිණිස හේතු නොවෙයි (නඋපසමාය) අභිඥ්ඥා පිණිස හේතු නොවෙයි (න අභිඥ්ඥාය) සම්බෝධිය පිණිස නොවෙයි

(න සම්බෝධාය) නිර්වාණය පිණිස නොවෙයි (න නිබ්බානාය) එහෙයින් මා විසින් ඒවා අව්‍යාකෘත යයි කියන ලදී. (තස්මා තං මයා අබ්‍යාකතං)

මේ අනුව සුවිශේෂි වශයෙන් බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය තුළ සාකච්ඡා වන කරුණු මොනවා දැයි පෙනේ. යථොක්ත නිර්ණායකයන් මත ඇතැම් කරුණු ප්‍රතික්ෂේප කරන බුදුසමය අවධාරණය කරනු ලබන්නේ පුද්ගලයාට නිවැරදි ඥානය පහළ කර ගැනීමට උපයුක්ත වන දේ පමණි.

බෞද්ධ අධ්‍යාපනයේ මුඛ්‍ය අරමුණ වන්නේ මිනිසා හෙවත් තමා කවරෙක් දැයි නිවැරදි ලෙස තේරුම් ගැනීමයි. (යථාභූතං පජානාති) ලොවට ඇති අතිශය දුෂ්කර වූත් ඉතාම වැදගත් වූත් කාර්යය වන්නේ 'මම' තේරුම් ගැනීම ය.[27]

පුද්ගලයා විසින් තමා කවුදැයි නිවැරදි වශයෙන් වටහා ගැනීමට අවබෝධ කර ගැනීමට අවශ්‍ය ඉඩ හසර නොමදව ලබාදී තිබේ. පුද්ගලයා විසින් අවධාරණයෙන් අවබෝධයට ගත යුත්තේ කෙබඳු ධර්මයක් ද යන්න මැනවින් අවධාරිත වී තිබේ.[28] චූල මාලුංක්‍ය හිමියන් විමසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු නොදීමට හේතු දක්වා ඇති අතර බුදුහිමියන් විසින් කියන ලද (බ්‍යාකතං) දේ අවධාරිතය.

''මාලුංක්‍ය පුත්‍රය මෙය දුකකැයි මා විසින් ව්‍යාකෘතය. මේ දුක්ඛ සමුදය යයි මා විසින් ව්‍යාකෘතය. මේ දුක්ඛ නිරෝධය යයි මා විසින් ව්‍යාකෘතය මේ දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදාව යයි මා විසින් ව්‍යාකෘතය. මාලුංක්‍යය මෙය මා විසින් කුමන අදහසින් ව්‍යාකෘත ද? යම් හෙයකින් තෙල අර්ථ සංහිත ද තෙල ආදි බ්‍රහ්මචර්යාවට ද ශිලමාත්‍රවේද මෙසෙයින් ඒ නිර්වේදය පිණිස, නිරෝධය පිණිස, ව්‍යුපසමය පිණිස, අභිඤ්ඤා පිණිස, සම්බෝධිය පිණිස නිර්වාණය පිණිස පවතී ද එහෙයින් එය මා විසින් ව්‍යාකෘතය.''[29]

පුද්ගලයා නැඹුරු කරවනු ලබන්නේ කෙබඳු අරමුණක් වෙත ද යන්න මැනවින් පැහැදිලි වන අවස්ථාවකි මෙය. අන්‍ය වූ භෞතිකවාදී සංකල්පයන්ගෙන් විනිර්මුක්තව ඒකායන පරමාර්ථයක්

ඇතිව පුද්ගලයා යහපත් අධ්‍යාපන ප්‍රවේශයක් කරා නැඹුරු කරවන අයුරු පෙනේ.

පුද්ගලයා යහපත් අධ්‍යාපන ප්‍රවේශයක් කරා සේන්දු කරවන බුදුසමය පුද්ගලයා සතු අභ්‍යන්තරික වූ කෙළෙස් ප්‍රහාණය කරවීම පිණිස අනවරත උත්සාහයක යෙදෙයි. නිර්වාණය පිණිස ගමන් කරන පුද්ගලයාට එය අවධාරනය කරනු ලබන කරුණු පසක් වන බව දක්වා තිබේ. ඒවා නීවරණ නම්වෙයි. කාමච්ජන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්චා[30] (පඤ්චිමානි භික්ඛවේ නීවරණානි, කතමානි පංච, කාමච්ජන්ද නීවරණං, ව්‍යාපාද නීවරණං, ථීනමිද්ධ නීවරණං, උද්ධච්ච කුක්කුච්ච නීවරනං, විචිකිච්චා නීවරණං, ඉමානි ඛො භික්ඛවේ පඤ්ච නීවරණානි) පුද්ගලයා මැනවින් තමා හඳුනාගැනීම පිණිස මෙම නීවරණයන් ගරු කළ යුතු වෙයි.

රූප, වේදනා, සංඥා, සංඛාරා, විඤ්ඤාණ යන උපාදානස්ඛන්ධයන් ද නිර්වාණාධිගමනය පිණිස ප්‍රහාණය කළ යුතු වෙයි.[31] දස සංයෝජනයන්[32] ගෙන් යුක්ත පුද්ගලයාට මෙන්ම අනුසය[33] ධර්මවලින් යුතු පුද්ගලයාට බෞද්ධ අධ්‍යාපනයේ සුවිශේෂී ස්ථානයක් හිමි නොවන අතර අන්‍යතීර්ථකයන් විසින් 'කුමක් හෙයින් බුදුන් සමීපයේ බඹසර වාසය කරන්නේ ද?'

නිවැරදි අරමුණකින් හෙබි බෞද්ධ අධ්‍යාපනය විසින් ශිෂ්‍යයාට නිවැරදි විෂයමාලාවක් හඳුන්වා දී තිබෙන බව පෙනේ. වෙසෙසින් ම ප්‍රථමයෙන් පුද්ගලයාගේ අභ්‍යන්තර කෙළෙස් ප්‍රහාණය පිණිස එමගින් දී ඇති උපදෙස් නොමද ය.

සමාජ හිතසුව හෝ පුද්ගල හිතසුව පිණිස නොපවතින කතා ප්‍රතික්ෂේප කොට තිබේ. මහණෙනි, නන්වැදෑරුම් තිරිසන් කතා නොකියවු (මා භික්ඛවේ අනේක විහිතං තිරච්ජාන කථං කථෙථ)

ප්‍රාණඝාතය[34] අදින්නාදානය,[35] කාමේසුමිච්ජාචාරය,[37] මුසාවාදය,[38] පිසුනාවාචය,[39] පරුසාවාචය,[40] සම්පප්‍රලාපය[41] යනාදියෙන් පුද්ගලයා වැලකිය යුතු වෙයි. ප්‍රධාන ඉලක්කය කරා ගමන් කිරීමේදී මෙකී සුචරිතවාදී ස්වභාවයෙන් පුද්ගල සංතානයේ ඇති කර ගත යුතු වෙයි. බෞද්ධ අධ්‍යාපනය නිර්වාණය නිෂ්ටාව කොට පවතින්නක්

වන අතර නිදහස් අධ්‍යාපනයක ලක්ෂණ එමගින් හෙළිවෙයි.[42] බාහිර බැඳීම් වලින් තොරව නිදහස් චින්තනයෙන් යුතුව පුද්ගලයා දැනුම ලබාගත යුතු ආකාරය මැනවින් පැහැදිලි කොට ඇති අයුරු කාලාම සූත්‍රයෙන් පැහැදිලි වෙයි. කාලාමයන් හට ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ කාලාමයෙනි, ඔබ සැකකිරීමත් විමතියට පැමිණීමත් සුදුසුමය. ඔබගේ සැකය ඇතිවූ තැන සැක සහිත තැනකි. කාලාමයෙනි ආරංචියෙන් හෝ පරම්පරාවෙන් ආ නිසා හෝ මෙහෙමලු යන කට කථාවෙන් හෝ මේ අපගේ ආගමික ග්‍රන්ථ සම්ප්‍රදාය යයි සිතීමෙන් හෝ තර්ක හේතුවෙන් හෝ ණය හේතුවෙන් හෝ, මේ කාරණය යහපත් සේ පෙනේ යැයි කල්පනා කිරීමෙන් හෝ, මෙය අප සිතාබලා ගත් දෘෂ්ටියට ගැලපේ යැයි සිතීමෙන් හෝ මොහු සුදුස්සෙකුයි සැලකීමෙන් හෝ මොහු - අපගේ ගුරුවරයාය යන හැඟීමෙන් හෝ නොපිළිගන්න. යම් විටෙක මේ දේ අයහපත් ය. අකුසලය වරදයයි ඔබට වැටහේද එවිට එය අත්හැර දමන්න. එසේම යම් විටෙක මේ දේ යහපත්ය අකුසලය නිවැරදිය යි ඔබට වැටහේ ද එවිට ඒ දේ පිළිගෙන පිළිපදින්න.[43] යනුවෙනි.

මේ අනුව බුදුරජාණන් වහන්සේ අවධාරණය කොට ඇති බව පෙනෙන්නේ තමාම ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කිරීම ය. අනුමානයෙන් ලබන ඥානය පූර්ණ නොවේ. විද්‍යාවේදී සැකය පවතිනාතුරු ඉදිරි ගමනක් නැත්තාසේම බුදුදහමෙහි ද 'විචිකිච්ඡාව' ඇති තුරු ඉදිරි ගමනක් නැත. සත්‍ය ප්‍රත්‍යක්ෂ කරලීම සඳහා ආදානග්‍රාහිත්වයෙන් තොරව සත්‍ය සෙවීමේ පරමාර්ථයෙන් ම ගවේෂණය කිරීම අවශ්‍ය ය.[44] මහා පරිනිබ්බාන සූත්‍රයේ දී (දී.නි.) සතර මහෝපදේශ දේශනාවේදී දක්වා ඇති පරිදි කිසියම් කෙනෙක් ''මෙය ධර්මයයි. මෙය විනයයි. ශාස්තෘන් වහන්සේ අනුශාසනය මෙයයි.'' යනුවෙන් කියන කල එය ගැන සතුට පළ නොකර අසතුට පළ නොකර (නෙව අභිනන්දිතබ්බං න පටික්කොසි තබ්බං) එය නිවැරදි දැයි විමසා බැලීම කළ යුතු ය. බ්‍රහ්මජාල සූත්‍රයේ ද[45] සඳහන් පරිදි බුදුරදුන් ගැන හෝ ධර්මය ගැන හෝ අසතුටු වීම නො කළ යුතු ය. එහිලා තොප කෝප වන්නාවූ නම් කෙසේ නම් තොප අනුන්ගේ එම වචනය නිවැරදිය කියා හෝ - වරද සහිත යයි කියා හෝ දත යුත්තාහු ද''[46]

මෙකී නිදසුන් වලින් පැහැදිලි වන්නේ බෞද්ධ අධ්‍යාපනය කෙතරම් විද්‍යානුකූල ද යන්න ය. නිදහස්ව නිවහල්ව පුද්ගලයාට කටයුතු කිරීමේ අයිතිය සුරක්ෂිත කොට ඇති අතර පුද්ගල සංතාන ගත ක්ලේෂ ධර්මයන් ඉවත් කොට ආර්ය අෂ්ටාංගික මාර්ග යේ ගමන්කොට බෞද්ධ අධ්‍යාපන අරමුණ - මස්තකප්‍රාප්ත කර ගැනීම සඳහා පුද්ගලයාට ඉඩ හසර සලසා තිබීම බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය තුළදක්නට ඇති සුවිශේෂ ලක්ෂණයකි. මංගල,[47] පරාභව,[48] වසල,[49] සහ සිඟාලෝවාද,[50] යන සූත්‍ර මේවායින් පිරී පවතී. යථෝක්ත සූත්‍රධර්මවල අන්තර්ගත අධ්‍යාපන අරමුණු විසින් බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදයේ ලක්ෂණ මැනවින් විශද කරයි.

බෙන්ජමින් බ්ලූම් විසින් (1956) ඉදිරිපත් කර ඇති අධ්‍යාපන වර්ගීකරණයේ ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් ඇත.

1. ප්‍රජානන ක්ෂේත්‍රය (Cognitive Domain)
2. ආවේදන ක්ෂේත්‍රය (Affective Domain)
3. මනෝචාලක ක්ෂේත්‍රය (Psychomoter Domain)

ප්‍රජානන ක්ෂේත්‍ර වර්ධනයේදී දැනුම (Knowledge) අවබෝධය (Comprechension) විශ්ලේෂණය (Analysis) සංස්ලේෂණය (Synthasle) හා ඇගයීම (Evaluation) යන අංශ සම්පූර්ණ විය යුතුව ඇත. බුදුසමය මානසික හැකියා හා ශක්තීන් වර්ධනය කොට ආත්ම සාක්ෂාත්කරණය මුඛ්‍ය අරමුණ කරගත් චර්යා මාර්ගයකි.[51] විජ්ජා හෙවත් ලෝකය පිළිබඳව පුද්ගලයා ලබන දැනුම ප්‍රජානන ක්ෂේත්‍ර ලෙස සැලකේ. ලෝකයේ අන්තයට ගමනින් යා නොහැකි ය. (ගමනෙන න වික්කබ්බො) ලෝකය අවබෝධය කිරීමෙන් එය කළ හැකි වෙයි. අභ්‍යන්තර හා බාහිර වශයෙන් පුද්ගලයා ලබා ගන්නා වූ ප්‍රජානන ක්ෂේත්‍රයේ දියුණුව අෂ්ට විද්‍යා යන්නෙන් දක්වා තිබේ.[52]

විදර්ශනා ඥානය, (නාම රූප ධර්මයන් හා එහි අනිත්‍යාවාදී ලක්ෂණ දන්නා නුවණ) මනෝමය ඍද්ධි ඥානය (තම කය තුළ තමා හා සමාන කයක් නිර්මාණය කර ගැනීමේ නුවණ) ඉද්ධිවිධ ඥානය (නා නා විද ඍද්ධීන් පෑ හැකි නුවණ) දිබ්බචක්ඛු ඥානය (ඒ ඒ සත්ත්වයන්ගේ චුති උත්පත්ති දක්නා නුවණ) අසවක්ඛය ඥානය (ආශ්‍රවක්ෂය නුවණ)

මෙම උසස් විද්‍යා ඥානය බෞද්ධ අධ්‍යාපනය තුළ පුද්ගලයා විසින් ම අවබෝධ කරගත හැකි ලෙස දක්වා තිබේ. ඉගෙනීම යනු අඳුරෙන් එළියට ඒමය (තමො ජොති පරායනො) එය වඩාත් වැඩි දියුණු කළ හැකි මග අර්හත් සංකල්පයයි. එය ආලෝකයෙන් ආලෝකයට ගමන් කිරීම (ජොති ජොති පරායන) ලෙස බෞද්ධ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අර්ථ ගැන්විය හැකිය.

රහත් වීමේ දී පවා දැනීමේ විවිධ අංග පවතින බව පෙනෙන්නේ ඇතැමෙක් සිව්පිළිඹියා (අත්ථ, ධම්ම, නිරුත්ති, පටිභාන) රහිත ද ඇතැමෙක් එකී සකලවිධ ශක්‍යතාවන් සහිතව ද රහත්වන නිසාවෙනි. පුද්ගලයා ලබන්නා වූ දැනුම් ක්ෂේත්‍ර අධ්‍යාපන අරමුණ මස්තකප්ප්‍රාප්තියට හේතුවන්නක් පමණි.[53] ''මහණෙනි මා ඔබට ධර්මය දේශනා කරමි. එය හැරදමා යාම පිණිස මිස රැගෙන යාම සඳහා නොවේ. (කුල්ලුපමං භික්ඛවේ ධම්මං දේසිස්සාමි නිත්ථරනත්ථාය නො ගහනත්ථාය) බෞද්ධ - අධ්‍යාපනයේ නිෂ්ටාව ලෙස රහත් සංකල්පය දැක්විය හැකිය.[54] (ඛීණා ජාති, වුසිතං කතං කරණීයං නාපරං ඉත්ථත්ථාය)

ආවේදනික ක්ෂේත්‍රයෙහි හෙවත් ආකල්පමය හැසිරීමෙහි චර්යාවන් පහළොවක්[55] පිළිබඳව සූත්‍ර ධර්මවල අවධාරණය කොට තිබේ. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය (චූලසීල, මජ්ජිමසීල, මහාසීල ඉන්ද්‍රිය සංවරය) (ඇස්, කන් ආදී ඉඳුරන්ගේ සංවරය) භෝජන මත්තඤ්ඤුතාව (ආහාරයේ ප්‍රමාණය දැනීම) ජාගරියානුයෝගය (කෙළෙස් නින්දෙන් අවදිව සිටීම) ශ්‍රද්ධාව (රත්‍රත්නය ගැන පැහැදීම) හිරිය (පවට පිළිකුල් ස්වභාවය) ඔත්තප්පය (පවට භය වන ස්වභාවය බහුශ්‍රැත බව) ධර්මයන් ප්‍රගුණ කර සිත්හි දරා සිටීම) වීර්යය (අකුසල් නැති කිරීමේ හා කුසල් වැඩීමේ උත්සාහය) ස්මෘතිය (මනා සිහිය) ප්‍රඥාව (විදර්ශනා හා මාර්ග ප්‍රඥාව) ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය.

මනෝ චාලක හෙවත් පුද්ගල සක්‍යතාවන් පිළිබඳව බෞද්ධ අධ්‍යාපනය තුළ සුවිශේෂ වශයෙන් නිර්දේශ කොට ඇත. සතර සම්‍යග්ප්‍රධාන[56] මගින් හෙළිවන්නේ පුද්ගලයා ඇති කර ගත යුතු කුශලතා සතරෙකි. යොනිසෝ මනසිකාරය (සති) විශ්ලේෂණ

සංස්ලේෂණය, බෙදා වෙන්කිරීම ආදියේ කුශලතාව (ධම්ම විචය) යමක් පුහුණු කරගෙන යාමේ, ශක්තිය (වීරිය) සන්තුෂ්ටිය (පීති) සිත නිවුණු ස්වභාවය (පස්සද්ධි), චිත්තෙකාග්‍ර) බව (සමාධි) උපේක්ෂාව (උපේක්ෂා) යන සත්ත බොජ්ඣංග[57] මගින් ඉන්ද්‍රිය සංවර කුශලතා පළ වේ.

මිනිසා යනු පුදුම සත්ත්වයෙකි. මිනිසා සහ මිනිස් ස්වභාවය මැනවින් හඳුනා ගැනීම කළ යුත්තකි. ඒ සඳහා සම්මුති වශයෙන් අප දකින මිනිසා කොටස් පහකට බෙදා තිබේ. විවිධ වර්ග කිරීම්වලට විශ්ලේෂණවලට වර්ග කොට ප්‍රථමයෙන් මිනිසා නිවැරදි ව වචන ගැනීමට උත්සහා දරා ඇත්තේ සංකීර්ණ වූ මිනිස් ස්වභාවයන් මැනවින් වටහා ගැනීම අත්‍යවශ්‍ය වූවක් වන බැවිනි. පටිච්චසමුප්පාදයේ දී කොටස් දොළහකට බෙදා තිබේ. එහි දී මිනිසා කරන හොඳ නරක ක්‍රියා අනුව සංඛාර ශක්තීන් ගොඩනැගෙන අයුරුත් ඒ අනුව විඤ්ඤාණය ක්‍රියාත්මක වන අයුරුත් මේ දෙකේ තුලනය මගින් පුනර්භවය ඇතිවන අයුරුත් පෙන්වා දී තිබේ. පටිච්චසමුප්පාදය පිළිබඳව ඉතා සරල පැහැදිලි විවරණ දෙකක් මහාචාර්ය ගල්මංගොඩ[58] මහතා සහ දේවාලේගම මේධානන්ද[59] හිමි යන කතුවරුන් සිය කෘතිවලින් දක්වා ඇත. ඒ තුළින් බුදුසමය පුද්ගලයා මැනවින් වටහා ගැනීම සඳහා ගනු ලැබූ ප්‍රයත්නය කෙබඳු ද යන්න පැහැදිලි වෙයි. මුල් බුදු සමයෙහි පුද්ගලයා පිළිබඳ ව කෙරෙන විවරණයන්හි දී පැහැදිලි වශයෙන් ම ප්‍රමුඛ ස්ථානයක් ලබා දී ඇත්තේ මිනිස් මොළයට යි. අන්‍ය ස්කන්ධ වලට වඩා ''විඤ්ඤාණ'' ස්කන්ධය මැනවින් අවබෝධ කර ගත යුතු සංකීර්ණ වූ ගැටළුවක් මෙන් දක්වා ඇති අතර එය කොටස් හයකට බෙදා දක්වා තිබේ.[60]

යථොක්ත සංවර්ධන කාර්යයෙහි ලා අනුගමනය කළ යුතු මෛත්‍රිය කරුණාව පෙරදැරි කොටගෙන සකස් වූ ආචාර ධර්ම පද්ධතියකුත්, සිහිය පෙරටු කරගත් චිත්ත භාවනා ක්‍රමයකුත් බුදුදහම ඉදිරිපත් කරයි. එම ආචාර ධර්මයන් මත පිහිටා චිත්ත භාවනා ප්‍රගුණ කරන විට මිනිස් මොළයේ සැඟවී ඇති ආසය, අනුසය වශයෙන් හඳුන්වනු ලබන විවිධ ආශාවන් ප්‍රතිසයන්, අවිද්‍යාවන්, දෘෂ්ටීන්, සංඛ්‍යාවන් මානයන් දුරු වී මොළය 'ප්‍රභාෂ්වර' භාවයට පත්වේ. එම ප්‍රභාවෙන් ආලෝකයෙන් ලොව ඇති තතු ඒ වූ අයුරින් විකෘත නොවී

දැක්ක හැකි ය. එවිට හෝ පරිපූර්ණභාවයට පත් මිනිසකු බවට පත්වේ. මෙම පරිපූර්ණත්වය කරා මිනිහා කරා මිනිසා ගෙන යන ප්‍රතිපදාව බුදුදහමේ හැඳින්වෙන්නේ 'බ්‍රහ්ම චරිය' (ශ්‍රේෂ්ඨ හැසිරීම)[61] නමිනි.

මුල් බුදුසමයේ මූලික සූත්‍රවල විස්තර කෙරෙන බ්‍රහ්මචර්යාව අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, (ක්‍රමික චර්යාව) අනුපුබ්බ පටිපදා ක්‍රමික ප්‍රතිපත්තිය යන (අනුපූර්ව ක්‍රමයට සකස් වී ඇති අතර මැදුම් සඟියේ දන්තභූමි සූත්‍රයෙහි[62] මෙම අනුපූර්ව ක්‍රමය වල් ඇතෙකුට ආනෙඤ්ජ සීලය පුහුණු කිරීම දක්වා සිදුකෙරෙන ක්‍රියා දාමය විස්තර කරමින් දක්වා ඇත.

බෞද්ධ අධ්‍යාපනයේ අරමුණ විමසා බලන්නකුට යථොක්ත සූත්‍රය වෙසෙසින් යහපත් ප්‍රවේශයක් සපයයි.

දැනුමෙන් සහ හැසිරීමෙන් යුක්තව රහත් බව දක්වා බෞද්ධ ශ්‍රාවකයා ගමන් කරනු ලබන අනුපූර්ව ක්‍රමය අම්බට්ඨ සූත්‍රයේදී[63] දක්වා තිබේ. අම්බට්ඨ විසින් බුදුරජාණන් වහන්සේගෙන් විජ්ජාචරණ යනු කුමක්දැයි අසයි. මෙයට බුදුරජාණන් වහන්සේ ලබාදෙන පිළිතුර තුළ අප යට සාකච්ඡා කරන ලද බෞද්ධ අනුපූර්ව ප්‍රතිපදාවක් බෞද්ධ අධ්‍යාපනයේ අරමුණත් මැනවින් පැහැදිලි වෙයි. යථොක්ත සූත්‍ර සාරය විමසා බැලීම මෙහිලා ප්‍රයෝජනවත් ය.

කිසියම් කුල පුත්‍රයෙක් බණ අසා බුදුන් කෙරෙහි පැහැදී ගිහිගෙයි දොස් දැක උන්වහන්සේ ළඟ පැවිදිවෙයි. හෙතෙම ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුතුව වාසය කරයි. ආචාර ගෝචර සම්පන්නව සුළුවරදක් වුව ද මහා වරදක් සේ සලකමින් වාසය කරයි. දිවිපැවත්මෙන් පිරිසිදුව ඉන්ද්‍රිය සංවරයෙන් යුතුව ආහාරයේ පමණ දැන සිහි නුවණින් යුතුව ලද දෙයින් සතුටුව වාසය කරයි.

ඔහු සතුන් මැරීමෙන්, සොරකම් කිරීමෙන්, මෛවුන්දම් සෙවීමෙන් බොරුකීමෙන් කේලාම් කීමෙන්, රළු වචන, හිස් වචන කීමෙන්, වැලකෙයි, බීජයන් ද පැළද විනාශ නොකරයි. නොකල්හි ආහාර ගැනීමෙන් වළකියි. නැටුම් ගැයුම් වැයුම් ආදි විකාරදේ බැලීම් නොකරයි. මල්ගඳ විලවුන් නොදරයි. උස් අසුන් මහ අසුන්වල නොහිඳී.

එම භික්ෂුව ඇස කන නහය දිව ශරීරය සිත යන සවැදෑරුම් ඉන්ද්‍රියන් සංවර කර ගනී. යෑම් ඊම් ඉඳීම් සිටීම් ආදි ඉරියව් පැවැත්ම සිහි නුවණින් යුතුව කරයි.

මෙසේ උතුම් වූ ශිලයෙන් උතුම් ඉන්ද්‍රිය සංවරයෙන්, උතුම් සති සම්පජඤ්ඤයෙන් යුක්ත වූ එම භික්ෂුව ජනයාගෙන් තොරව විවේක සේනාසනයක වාසය කරමින් දිවා භෝජනයෙන් පසු පලක් බැඳ හිත කමටහනට යොමුකොට සිටී. හෙතෙම අභිධ්‍යාව, (දැඩි ලෝභය) ව්‍යාපාදය (ක්‍රෝධය) ථීන මිද්ධ (සිතේ හා කයේ මැලිබව) උද්ධච්ච (සිතේ නොසන්සුන් බව) කුක්කුච්ච (කුකුස) විචිකිච්චා (සැකය) යන පංචනීවරණ (නිවන මග අවුරන) දුරුකොට සිත පිරිසිදු කොට ගනී.

එම භික්ෂුව කාමයන්ගෙන් වෙන්ව සමාධිව වඩා ප්‍රථම ධ්‍යානය ලබා ගනී. ඉන්පසු දෙවන, තෙවන, සිවුවන ධ්‍යානයන් ලබා ගනී. මෙසේ ධ්‍යාන සතර ලබා ගැනීම චරණ ධර්ම නම් වේ.

මෙසේ සිත සංසිඳුණු කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, උපක්කිලේස පහවූ කල්හි විදර්ශනාවට සිත යොමු වෙයි. මේ ශරීරය රූප ධර්මයකි. සතර මහා භූත වලින් සැදුණේය. මව්පියන්ගේ ශුක්‍ර ශ්‍රොණි දෙකින් හට ගත්තේ ය. ආහාර වලින් වැඩුණේ ය. අනිත්‍යය, දුගඳ දුරු කිරීමට සුවද විලවුන් ගැල්විය යුතු ය. ලෙඩ දුරලීමට වෙද හෙදකම් කළ යුතු ය. එසේ කළත් බිඳෙන සුළුය. විසිරෙන සුළුය. මාගේ සිත එබඳු වූ කයෙහි ලැග්ගේ ය. බැඳුණේ ය ඔහු දැන ගනී. මෙය ඔහු ලැබූ විද්‍යා ඥානයකි.

තවදුරටත් තම සිත ධ්‍යානයෙන් සමාහිත වූ කල්හි මනෝමයශරීරයක් මවා පෑමට සිත යොමු කොට එය කරයි. ඍද්ධිවිධ ඥානය කෙරෙහි හිත යොමු කොට එම ඥානය ලබා ළඟ හා දුර සිදුවෙන දේ බලයි. චේතොපරිය ඥානය පිණිස සිත යොමු කොට එය ලබා ලෝකයේ නොයෙක් දේ අසයි. පුබ්බේනිවාසානුස්සති (සත්ත්වයන් පෙර විසූ කඳ පිළිවෙළ) කෙරේ සිත යොමු කොට එය ලබා සත්ත්වයන්ගේ ආත්ම භාවයන් පිළිබඳව බලයි. චූතුපපාත ඥානය කෙරෙහි සිත යොමු කොට එය ලබා කුසල් අකුසල් කරන්නවුන් ද මිය යාමට ළංව සිටින්නවුන් ද මියගොස් උපදින අයුරු දැන ගනී.

මේ සියලු ඥාන පුද්ගලයා ලබන විද්‍යා ඥාන ලෙස දක්වා ඇති අතර කාමාසව, භවාසව, අවිජ්ජාසව, යන ආශ්‍රවයන් ගෙන් මිදීම පුද්ගලයා උසස් ම ඥානය ලෙස දක්වා තිබේ.

බුදුරජාණන් වහන්සේ විසින් දක්වා ඇති මෙම උසස් ඥානය ලබා රහත් වීම දක්වා පුද්ගලයා ගමන් කරන අනුපූර්ව මාර්ගයේ දී පුද්ගලයා වැඩිය යුතු චූල සීල, මජ්ඣිම සීල, මහා සීල, යනුවෙන් කොටස් තුනක් ද[64] සප්පුරිය සංවාසය (විෂය මැනවින් දත් ආදර්ශවත් ගුරුවරයකු ලැබීම) සද්ධම්ම සවණ (විෂය මැනවින් දත් ගුරුවරයා යටතේ ධර්මතා පිළිබඳව අධ්‍යයනය කළ යුතු බව) යොනිසෝ මනසිකාරය (විද්‍යාත්මක ලෙස කරුණු විමසා බැලීම) ධම්මානුධම්ම පටිපත්ති (උගත්දේ තමාගේ මෙන්ම අනුන්ගේ යහපත පිණිස ක්‍රියාත්මක කිරීම) යනාදි වශයෙන් කරුණු සතරක් ද දක්වා ඇත.[65]

## ආන්තික සටහන්


1. Boyd William, Emile For Today, 1967, p.11
2. තමොතම පරායන සූත්‍රය
3. අතුකෝරළ දයාරෝහණ - අතුකෝරළ හේලි නිමලා - අධ්‍යාපන මූල ධර්ම ලිපි, ශික්‍ෂා මන්දිර
4. මනෝපුබ්බංගමා ධම්මා..., ධම්ම පදය, යමක වග්ගය, 01 ගාථාව
5. ධම්මපදය, චිත්ත වග්ගයල 11 ගාථාව.
   ''න තං මාතා පිතා කයිරා - අඤ්ඤේ වා පි ච ඤාතකා
   සම්මා පණිහිතං චිතතං - සෙය්‍යසො නං තතො කරෙ''
6. ධම්මපදය, චිත්ත වග්ගයල 11 ගාථාව.
   ''දිසො දිසං යං තං කයිරා - වෙරි වා පන වෙරිනං
   මිච්ජාපණිහිතං චිත්තං - පාපියො නං තතො කරෙ''
7. ම.නි. 1, අරියපරියෙසන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල, පිට 394.
8. අ.නි. 1.
9. අතුකෝරළ, දයාරෝහණ, දිවිපැවැත්ම සඳහා ඉගෙනීම, ශික්ෂා මන්දිර ප්‍රකාශන, පානදුර, 1991, පිට 45.
10. හේවගේ, එල් ජී, බෞද්ධ අධ්‍යාපන සංකල්ප විග්‍රහයක්, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, වජ්‍රජයන්ති ප්‍රකාශනය.
11. චන්දවිමල හිමි, රේරුකානේ, බෝධිපාක්ෂික ධර්ම විස්තරය, චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, බොරලැස්ගමුව, 1994.

12. එම
13. ම.නි. 11, මහා සකුළුදායි සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 334
14. ම.නි. 1, සතිපට්ඨාන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 152.
15. ධම්මපදය - සුඛ වග්ගය, 1 ගාථාව.
    ''සුසුඛං වත ජීවා ම - වෙරිනෙසු අවෙරිනො
    වෙරිනෙසු මනුස්සෙසු - විහරාම අවෙරිනො''
16. ධම්මපදය - සුඛ වග්ගය, 2 ගාථාව.
    ''සුසුඛං වත ජීවා ම - ආතුරෙසු අනාතුරා
    ආතුරෙසු මනුස්සෙසු - විහරාම අනාතුරා''
17. සං.නි. 5, (2) ධම්මචක්කපවත්තන සූත්‍රය, බූ.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 270
18. සං.නි. 3, අනන්ත සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 38.
19. මහාවග්ගපාලි ,මහාක්ඛණ්ධකය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 42.
20. මහාවග්ගපාලි, මහාක්ඛණ්ධකය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 48.
21. මහාවග්ගපාලි, මහාක්ඛණ්ධකය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 49.
22. ම.නි., චූල සච්චක සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල, පිට 540.
23. සෙය්‍යථාපි භික්ඛවේ මහාසමුද්දො ඒක රසො ලොහ රසො ඒව මේව ධම්ම විනයේ ඒකරසෝ විමුක්ති රසො, චුල්ල වග්ග පාලි
24. ම.නි. 2, චූලමාලුංඛ්‍ය සූත්‍රයල බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 152.
25. ම.නි. 2, චූලමාලුංඛ්‍ය සූත්‍රයල බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල, පිට 152.
    1. සස්සතො ලොකො
    2. අසස්සතො ලොකො
    3. අන්තවා ලොකො
    4. අනන්තවා ලොකො
    5. තං ජීවං තං සරීරං
    6. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං
    7. හොති තථාගතො පරම්මරණා
    8. න හොති තථාගතො පරම්මරණා
    9. හොති ච න හොති ච තථාගතො පරම්මරණා
    10. නෙව හොති න නහොති තථාගතො පරම්මරණා
26. ම.නි. 2, චූලමාලුංඛ සූත්‍රය, පිට 152.
27. සිරිධම්ම හිමි, ලබුදූවේ, බෞද්ධ අධ්‍යාපනයේ අරමුණ, ගුණසේන වෙසක් කලාපය, 1983.
28. ම.නි. 2, චූලමාලුංඛ සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල පිට 162 (බු.ජ.ත්‍රි.ග්‍ර.මා.)
29. කිංච මාලුංක්‍යපුත්ත මයා බ්‍යාකතං ඉදං දුක්ඛන්ති මාලුංක්‍යපුත්ත මයා ඛ්‍යාකතං.

අයං දුක්ඛ සමුදයෝති මයා බ්‍යාකතං. කස්මා චේතං මාලුංක්‍යපුත්ත මයා බ්‍යාකතං මාලුංක්‍යපුත්ත, අතථසංහිතාය,ඒතං ආදි බ්‍රහ්මචරියං ඒතං නිබ්බිදාය, විරාගාය, නිරෝධාය උපසමාය, අභිඤ්ඤාය, සම්බෝධාය නිබ්බානාය සංවත්තක තස්මා තං මයා බ්‍යාකතං. ම.නි. 2, චූලමාලුංඛ්‍ය සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.ල, පිට 162.

30. විසුද්ධිමග්ගය.
31. සං. නි. 5, (1) උපාදානක්ඛන්ධ සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල.
32. සං. නි. 5, (1) සංයෝජන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 44.
33. සං. නි. 5, (1) අනුසය සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 44.
34. සං. නි. 5, (2)තිරච්ජානකථා සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 268.
35. සං. නි. 5, (2) පාණාතිපාත සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 338.
36. සං. නි. 5, (2) අදින්නාදාන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 338.
37. සං. නි. 5, (2) කාමේසුමිච්ඡාචාර සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 338.
38. සං. නි. 5, (2) මුසාවාද සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 338.
39. සං. නි. 5, (2) පිසුනාවාචා සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 338.
40. සං. නි. 5, (2) පරුසාවාචා සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 338.
41. සං. නි. 5, (2) සම්පප්‍රලාප සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 340.
42. අං. නි. 5, කාලාම සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල පිට 336.
43. අං. නි. 5, කාලාම සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 336.
44. දි. නි. 2, මහාපරිනිබ්බාන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 110.
45. දි. නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 02.
46. ඤාණතිලක, තිස්ස, මිනිස් ගැටළු පිළිබඳ බෞද්ධ විග්‍රහය, චතුර මුද්‍රණ ශිල්පියෝ, වැල්ලම්පිටිය, 1984, පිට 18.
47. සු. නි., මංගල සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 80.
48. සු. නි., පරාභව සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 30.
49. සු. නි., වසල සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 36.
50. දි. නි., සිගාලෝවාද සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල පිට 304.
51. අබේරත්න, කේ.එම්., විසුද්ධි මාර්ගයෙන් හෙළිවන අධ්‍යාපන සංකල්ප, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1989, පිට 82.
52. දි. නි. 1, අම්භට්ඨ සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 150.
53. දි. නි. 1, අලගද්දූපම සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 346.
54. ම. නි. 2, අපණ්ණක සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල, පිට 128.
55. ම. නි. 2, සේඛ සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල පිට 28.
56. දී. නි. 3, සම්පාදනීය සූත්‍රය.
57. දී. නි. 2, පරිනිබ්බාන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මාල පිට 110.

58. ගල්මංගොඩ, සුමනපාල, ආදි බෞද්ධ දර්ශනය, අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ, කඩවත, 1994.

59. මේධානන්ද හිමි, දේවාලේගම, බුදුසමය දර්ශනය සහ සංස්කෘතිය, ඉන්දික මුද්‍රණ.

60. සං. නි. 3, පිට 6.

61. සිරිධම්ම හිමි, ලබුදූවේ, බෞද්ධ අධ්‍යාපනයේ අරමුණ, ගුණසේන වෙසක් කලාපය, 1983.

62. ම.නි. දන්තභූමි සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.

63. දී.නි 1. අම්බට්ඨ සූත්‍රය, පිට 150.

64. දී.නි. බ්‍රහ්මජාල සූත්‍රය, පිට 02

65. ම.නි. සත්පුරිය සූත්‍රය, උපරිපණ්ණාසක.